# කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇත්කඳ රජමහා විහාරයේ පුස්කොළ පොත් එකතුව පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**නුගගොල්ලේ උපරතන හිමි,**

**සංක්ෂේපය**

මෙම පර්යේෂණයේ දී ප්‍රධාන අරමුණ වුයේ ශ්‍රී ලංකාවේ සුරක්ෂිත කොට අරක්ෂා කරනු ලබන පුස්කොළ පොත් පිළිබඳව ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක නිරත වීමයි. ශ්‍රී ලංකාවේ පිහිටි සෑම රජමහා විහාරයක් ම ආවරණය කළ නොහැකි නිසා පුස්කොළ පොත් බොහොමයක් පවතින ඇත්කඳ රජමහා විහාරය නියැදිය වශයෙන් තෝරාගැනීමට හේතුව වන්නේ එම විහාරස්ථානය කුරුණෑගල යුගයට අයත් රජමහා විහාරටයට අයත් විහාරයක් වන අතර එම විහාරයේ පුස්කොළ එකතුව ග්‍රන්ථ විද්‍යාත්මක තත්වය පිළිබඳව විමසා බැලීමක් කළ හැකිය.

පුස්කොළ පොත් අධ්‍යයනයට ලක් කිරීමේ දී විෂය ක්ෂේත්‍රය හඳුනා ගැනීමට අමතරව එම පුස්කොළ පොත්වල ග්‍රන්ථ විද්‍යාත්මක ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමුකිරීමටද මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වූ අතරම පුස්කොළ පොත් පිළිබඳව ක්‍රමවත් ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර කවරේද යන්න පිළිබඳවත් නොයෙක් ප්‍රමිති කුමක්දැයි සොයා බැලීමත් මෙහිදී සිදු කෙරේ.

පුස්කොළ පොත් පිළිබඳව වාර්තාගත කිරීමේ දී මෙම අධ්‍යයනය සඳහා භාවිත කළ යුතු විස්තරාංග සංඛ්‍යා ලේඛනාවලිය පෙළ ගැස්වීමේ විධික්‍රමය යන කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරිණි.

මෙහි නිගමනය වූයේ වැඩි කොටසක් ත්‍රිපිටකගත පොත් වූ අතර මජ්ඣිම නිකාය, දීඝ නිකාය, සංයුක්ත නිකාය, ආදී පුස්කොළ මෙහි විය. මෙම විහාරස්ථානයේ පුස්කොළ පොත් 90ක් පමණ දක්නට හැකි විය. එමෙන් ම විශාල පොත වශයෙන් ඉපැරණි ජාතක පොත් වහන්සේ විය. මෙම පොත් වහන්සේ ඉපැරණි රජදවස පටන් අද දක්වාම පෙරහැරේ වඩමවන ලද පොත් වහන්සේ ද වෙයි. මෙම රජමහා විහාරයේ පුස්කොළ පොත් එකතුව ඉතා ආරක්ෂිත එකතුවක් බව පෙන්වාදිය හැකි ය.

ප්‍රමුඛ පද :- ඇත්කඳ රජමහා විහාරය, කුරුණෑගල දිස්ත්‍රික්කය, පුස්කොළ පොත් එකතු, පුස්කොළ පොත්, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු

*1. පුස්තකාල විද්‍යාව, පුස්තකාලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*